ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
සමාජ අධ්‍යයන අංශය
සමාජ විද්‍යා උසස් සහතික පත්‍ර පාඨමාලාව
11 මට්ටම -1 වර්ෂාර්ධය
අධ්‍යයන වර්ෂය - 2023/2024
අවසාන පරීක්ෂණය
**DSC2812 - ආර්ථික විද්‍යාවේ මූලිකාංග**
කාලය - පැය තුනයි (03)

---

දිනය : 2023.12.09. වේලාව : ප. ව. 01.30 - ප.ව.04.30

---

උපදෙස් :

- ඕනෑම ප්‍රශ්න පහකට(05) පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු විස්ස (20) බැගින් හිමි වේ.
- ඔබගේ පිළිතුරු පැහැදිලිව ලියන්න.

1. a). ආර්ථිකයක තීරණ ගන්නන් විසින් මුහුණ දෙන ප්‍රධාන ආර්ථික ප්‍රශ්න කවරේද ?
(ලකුණු 07 )

b). වෙළෙඳපොළ ආර්ථිකයක ලක්ෂණ මොනවා ද ?
(ලකුණු 08 )

C). නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයෙන් පෙන්නුම් කරන්නේ කුමක්ද?
(ලකුණු 05 )

2. a). සාමාන්‍යයෙන්, ඉල්ලුම් වක්‍රයන් පහළට බෑවුම් වන්නේ කුමක් නිසාද?
(ලකුණු 07 )

b). මිල ඉල්ලුම් නම්‍යතාවය යන සංකල්පයේ තේරුම හා වැදගත්කම පැහැදිලි කරන්න.
(ලකුණු 08 )

C). භාණ්ඩයක සැපයුම් නම්‍යතාවය යනු කුමක්ද ?
(ලකුණු 05 )

3. a). තරගකාරී වෙළෙඳ පොළවල් මත වැඩි විශ්වාසයක් තැබීම සුදුසු යැයි ආර්ථික විද්‍යාඥයන් බොහෝ විට විශ්වාස කරන්නේ ඇයි ?
(ලකුණු 08 )

b). පූර්ණ තරගකාරී ආයතන මිල ගැනුම්කරුවන් වන්නේ ඇයි?
(ලකුණු 07 )

C). ඒකාධිකාරයක් පැන නැගීමට හේතු කවරේද?
(ලකුණු 05 )

4. a). නිෂ්පාදන ආයතනයක් යනු කුමක්ද? එමඟින් සිදු කෙරෙන්නේ කුමක්ද ?

(ලකුණු 07 )

b). නිෂ්පාදන සාධක යනු මොනවාද සහ ඒවාගේ ප්‍රතිලාභ කවරේද?

(ලකුණු 08 )

c). සමතුලිතය යනු කුමක්ද? එය වෙළඳපොළක් තුළ හට ගන්නේ කෙසේද?

(ලකුණු 05 )

5. a). ආදායමේ චක්‍රීය ප්‍රවාහ ආකෘතිය යනු කුමක්ද?

(ලකුණු 08 )

b). සාර්ව ආර්ථික විද්‍යාව තුළ අප ආදායමේ චක්‍රීය ප්‍රවාහ ආකෘතිය භාවිත කරන්නේ කුමක් නිසාද?

(ලකුණු 07 )

c). සාර්ව ආර්ථික සමතුලිතය යනුවෙන් හදුන්වන්නේ කුමක්ද?

(ලකුණු 05)

6. a). විරැකියා අනුපාතය යනු කුමක්ද?

b). සේවා වියුක්ති වර්ග විස්තර කරන්න.

c). ස්වාභාවික විරැකියා අනුපාතය විස්තර කරන්න.

d). ඌන සේවා නියුක්ති සංකල්ප පැහැදිලි කරන්න.

( එකකට ලකුණු 05 බැගින්)

7. a). "උද්ධමනය යනු සාමාන්‍ය මිල මට්ටම්වල වැඩි වීමක් මිස කිසියම් නිශ්චිත මිලක වැඩිවීමක් නොවේ." විස්තර කරන්න.

(ලකුණු 07 )

b). ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය හා පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය පැහැදිලි කරන්න. ඒ එක් එක් ඒවාට හේතු මොනවාද?

(ලකුණු 08

c). උද්ධමනය සෑම අයෙකුටම එකම මට්ටමකට බලපාන බව ඔබ විශ්වාස කරනවාද? ඔබගේ පිළිතුර සාධාරණීකරණය කරන්න.

(ලකුණු 05 )

00104

8. a). මුදලෙහි කාර්යයන් පැහැදිලි කරන්න.

(ලකුණු 08 )

b). විවිධ මුදල් වර්ග විස්තර කරන්න.

(ලකුණු 07)

c). වාණිජ බැංකුවල කාර්යයන් මොනවාද?

(ලකුණු 05 )

9. පහත දෑ අතුරින් ඕනෑම හතරක් (04ක්) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

a). ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ

b). ජාත්‍යන්තර සංක්‍රමණ

c). ජනඝනත්වය

d). ගෙවුම් ශේෂය

e). සාපේක්ෂ වාසිය

f). දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.)

g). සාධක වෙළෙඳපොළ

h). මිල වෙනස්කම් කිරීම

( එකකට ලකුණු 05 බැගින්)

********** සියලුම හිමිකම් ඇවිරිණි **********